# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## ශාස්ත්‍රපති සමාජවිද්‍යාව පශ්චාද් උපාධි එක් අවුරුදු පාඨමාලාව
## Master of Sociology – One Year Programme
## 9th Intake 2025

සමාජවිද්‍යා අධ්‍යයනාංශය මගින් මෙහෙයවනු ලබන ඉහත පාඨමාලාව සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර 2025 සැප්තැම්බර් 30 දින දක්වා කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම්**

(1) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සමාජවිද්‍යාව විශේෂ ගෞරව උපාධිය
(2) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජවිද්‍යාව විෂය සහිතව ලබාගත් සාමාන්‍ය උපාධිය
(3) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම හා අවුරුදු තුනකට නොඅඩු අදාළ රැකියා ක්ෂේත්‍රයක පළපුරුද්ද හෝ පර්යේෂණ සුදුසුකම්වලින් සමන්විත වීම

**පාඨමාලාවේ දේශන –** ඉරිදා පෙ.ව 8.00 සිට ප.ව 5.00 දක්වා විශ්වවිද්‍යාලය තුළදී පැවැත්වේ.

මෙම උපාධි පාඨමාලාව සමත්වීම සමාජවිද්‍යාව දර්ශනපති (MPhil) / දර්ශනසූරි (PhD) උපාධි දක්වා යාමට සුදුසුකමක් වනු ඇත.

**පාඨමාලා ගාස්තුව**

රුපියල් එක් ලක්ෂ හැට දහසකි (රුපියල් 160,000.00). (ලියාපදිංචි ගාස්තු, පුස්තකාල ගාස්තු, විභාග ගාස්තු සහ නැවත ගෙවන පුස්තකාල ගාස්තු ද එයට ඇතුළත් වේ.) සමාන වාරික දෙකකින් ගෙවිය හැකිය.

අයදුම් කිරීම - පාඨමාලාවට අයදුම් කිරීමට සහ සියලු විස්තර සඳහා www.graduate.sjp.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න. එයින් බාගතකරගන්නා අයදුම්පත්‍රය ඕනෑම මහජන බැංකු ශාඛාවක ගිණුම් අංක 053010006830 ට රුපියල් තුන්දහසක් (රුපියල් 3000.00) බැරකොට ලබාගත් රිසිට් පත ද සමඟ අදාළ සහතික පත්‍රවල සහතික කරගත් පිටපත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන්න.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ
011 280 2695

**පාඨමාලාව සඳහා විමසීම්**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මයුර සමරකෝන්
පශ්චාද් උපාධි පාඨමාලා සමායෝජක
සමාජවිද්‍යා අධ්‍යනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
071 355 4819 / 071 416 6083 / 011 280 2207

ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය